13

දකුණු පළාත් ඒකාබද්ධ මෝටර් රථ රියදුරන් සඳහා වන සේවා ව්‍යවස්ථාව

සම්බන්ධ වන ආයතන

කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම

යොමු අංකය:..................... දිනය:2013.01.01

ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය

යොමු අංකය:..................... දිනය:...............

ප්‍රධාන ලේකම් (දකුණු පළාත) නිර්දේශය

යොමු අංකය: CSS/2/6/2/3 දිනය 2015.06. 22

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය

යොමු අංකය: SP/PSC/13/11 දිනය: 2015/07/03

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය

යොමු අංකය :..................... දිනය:...............

සත්‍ය පිටපතකි
TRUE COPY
.................. දිනය 2015/07/24

කේ. කේ. ජේ. රොෂාන්
පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
දකුණු පළාත

1. ක්‍රියාත්මක වන දිනය -

මෙම ව්‍යවස්ථා සංග්‍රහය 2013.07.01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

2. පත් කිරීම් බලධරයා:

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින් බලය පවරන ලද දකුණු පළාත් ප්‍රධාන ලේකම්

3. සේවා ගණය -: ප්‍රාථමික ශිල්පීය සේවා ගණය

4. පැවරෙන කාර්ය භාරය: ආයතනයක් වෙත පැවරෙන කාර්යයන් ඉටුකිරීම හා පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වන ප්‍රවාහන කාර්යයන් ඉටුකිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කෙරෙන මෝටර් රථ රියදුරු බලපත්‍රයක් දරන තැනැත්තන්ගෙන් සමන්විත සේවා ගණයකි.

4.1 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

5. වැටුප් :

5.1 වැටුප් කේත අංකය : (PL3-2006A)

5.2 වැටුප් පරිමාණය : (රු 12,470-10 x 130-10 x145-10x160-12x170-18,860)

................ 256
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2015 . 07 . 22 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. ... 22
2015/07/24
ආණ්ඩුකාර ලේකම්

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය |
|---|---|---|
| III | පියවර 01 | රු.12,470/- |
| II | පියවර 12 | රු.13,915/- |
| I | පියවර 22 | රු.15,380/- |
| විශේෂ ශ්‍රේණිය | පියවර 32 | රු.16,990/- |

6. සේවයට අයත් තනතුරු :

6.1 අනුමත තනතුරු නාම, තනතුරු අනුමත ශ්‍රේණි : රියදුරු III, II, I හා විශේෂ

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 616 *

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I හා විශේෂ ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

* (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩල සමාලෝචනයන් යටතේ දකුණු පළාත් ඒකාබද්ධ රියදුරු සේවයට අනුමත තනතුරු සංඛ්‍යාව කලින් කලට වෙනස් විය හැක.)

6.3 තනතුරෙහි/තනතුරුවල ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

7. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

අංකය 256

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2015.07.22 දින අනුමත කරන ලද බව සහතික කරමු. පිටු 22 කි.

2015/07/24

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය .

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වී තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් :

(1) පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

සත්‍ය පිටපති
TRUE COPY
දිනය 2015.07.29

... අංකය ..... 256
දකුණු පළාත් ගරු ..........................
විසින් 2015.07.22 දින අනුමත කොට ඇති බව
සහතික කරමි. පිටු ....... 22 කි.
2015/07/24
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

(බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් සී සහ සී1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ඊ පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතු ය.)

(2) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය.

7.2.2.3 පළපුරුද්ද :වාහන් රියදුරකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතු ය. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතු ය)

7.2.2.4 කායික සුදුසුකම් :

* අවම උස අඩි 05ක් විය යුතු ය.
* දිවා කාලයේ සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය. රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන ලද විධිමත් සහතිකයක් මගින් ඒ බව සනාථ කළ යුතු ය.

සත්‍ය පිටපත
TRUE COPY

7.2.2.5 වෙනත් සුදුසුකම් :

1) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2) දකුණු පළාතේ වසර 5ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.
3) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
4) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 හා 7.2.3 හි සඳහන් සියළුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 45ට නොවැඩි

සටහන : දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින්

7.2.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| I.රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| II. මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| III. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2015.07.22
සහතික කරමි. 22
2015/07/24

7.2.4.2.1 වෘත්තීය පරීක්ෂණය පවත්වන බලධරයා :

දකුණු පළාත් ප්‍රධාන ලේකම් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

බඳවා ගැනීමේ පරීක්ෂණය පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත තිදෙනෙකුට නොඅඩු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පැවැත්විය යුතුවේ.

i. ප්‍රධාන ලේකම් කාර්යාල විධායක නිලධාරියකු එක් නියෝජිතයකු ලෙස
ii. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ වාහන පරීක්ෂකයකු
iii. පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකු

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : බඳවා ගැනීමේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම, ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා:

දකුණු පළාත් ප්‍රධාන ලේකම්

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :

රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින්

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ

7.4 කුසලතා පදනම මත බඳවා ග

පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
දකුණු පළාත

සත්‍ය පිටපතකි
TRUE COPY
දිනය.2015/07/29

8. කාර්යක්ෂමතා කඩඉම් :

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| පළමු කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය හා වාචික පරීක්ෂණය (පරිශිෂ්ටය 01) |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගතවීමට පෙර | නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය (පරිශිෂ්ටය 02) |
| තෙවන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර | නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය (පරිශිෂ්ටය 03) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණය පවත්වනු ලබන බලධාරීන් කවුරුන්ද :

අ. දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය මත දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අදාළ පරීක්ෂණය පැවැත්විය යුතුය.

1. දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ විධායක මට්ටමේ නිලධාරියකු සභාපති ලෙස
2. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකවරයකු
3. පොලිස් රථවාහන අංශයේ නිලධාරියකු

9. භාෂා ප්‍රවීණතාව :

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබාගත යුතු ය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය. |

10. ශ්‍රේණි උසස් කිරීම : කාර්ය සාධනය පදනම් කරගත් පහත දැක්වෙන උසස් වීම ක්‍රමයක් ක්‍රියාත්මක කෙරේ.

256

දකුණු පළාත් ආණ්ඩුකාරතුමා විසින් 2015.07.22 අනුමත කොට ඇති බව සහතික කරමි. පිටු 22

2015/07/24 ආණ්ඩුකාර ලේකම් දකුණු පළාත

10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. පත්වීම ස්ථිර කර තිබීම

ii. සේවා ශ්‍රේණියේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයා ගෙන තිබීම,

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම කර තිබීම.

iv. උසස්කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

vii තාර බර කොණ්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ සඳහා රියදුරු බලපත්‍රයක් ලබා තිබීම (ඒ1 සහ සී1 පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී සහ සී1 පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)

කේ. කේ. ජේ. [illegible]
පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
දකුණු පළාත

සත්‍ය පිටපතකි
TRUE COPY

ශ 256
... ආණ්ඩුකාරතුමා
2015. 07.22 දින අනුමත කොට ඇත් බව
සහතික කරමු. පිටු 22 කි.
2015/07/28
...

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය (අයදුම්පත්‍ර අංක 01) අනුව ආයතන ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම් මගින් නිර්දේශ සහිතව දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් සපුරන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලැබේ.

## 10.2 II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

### 10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

#### 10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන තිබීම.
ii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05)තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.
v. භාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු ය. (ඒ පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ඩී පන්තියේ බලපත්‍රයක් තිබිය යුතුය.)

#### 10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය (අයදුම්පත්‍ර අංක 02) අනුව ආයතන ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම් මගින් නිර්දේශ සහිතව දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව I ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් සිදු කරනු ලැබේ.

## 10.3 I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

### 10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

#### 10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවයක (09) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ක් උපයා ගෙන තිබීම.

ii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

එච්. කේ. ජේ. රොෂාන්
පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
දකුණු පළාත

සත්‍ය පිටපතකි
TRUE COPY
දිනය 2015/07

......... අංකය 256
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2015.07.22 දින අනුමත කොට ... [illegible]
සහතික කරමු. පිටු 22 කි.
2015/07/24
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

iii. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්ව තිබීම.

10.3.1.2. උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය (අයදුම්පත්‍ර අංක 03) අනුව ආයතන ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම් මගින් නිර්දේශ සහිතව දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලැබේ.

සංලක්ෂය

සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතු ය.

## 11. සේවයට අදාළ කොන්දේසි :

සේවයේ III වන ශ්‍රේණියට පත් කරනු ලැබූ නිලධාරියෙකු තුන් වසරක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර ඔහු පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ හා හැසිරීම, සේවයට පැමිණීම, සතුටුදායකව අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් සහ පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබේ නම් පරිවාස කාලය අවසාන දී සේවයේ ස්ථිර කරනු ලැබේ.

## 12. අර්ථ නිරූපණ හා නිර්වචන :

12.1 "ව්‍යවස්ථා සංග්‍රහය" යන පදයෙන් අදහස් කරන්නේ දකුණු පළාත් රාජ්‍ය සේවයේ රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයයි.

12.2 "සේවය" යන පදයෙන් අදහස් කරන්නේ දකුණු පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු සේවාවයි.

12.3 "සතුටුදායක සේවා කාලය" යනු රාජ්‍ය නිලධාරියකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින්ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත් වීම මගින්ද, ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය තුළ උපයාගත යුතු ව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම ලැබිය යුතු වරදක් සිදු නොකර ලද්දාවූ කාල සීමාවක් වන්නේය.

12.4 "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේ ය.

12.5 අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු දිනය "නියමිත දිනය" ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම් වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් වන නිලධාරීන් බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් පරිදි උසස් වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

සත්‍ය පිටපතකි
TRUE COPY
දිනය 2015/...

කේ. කේ. ජේ. රොෂාන්
පරිපාලන නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය.

13. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබාදී ඇති PL-03-2006A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියලුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේවතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව පවතී. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්ති අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතු ය. නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට,

i. දකුණු පළාත් ඒකාබද්ධ රියදුරු සේවයේ II "ආ" පන්තියේ සේවයේ නියුතු නිලධාරීන් III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

ii. දකුණු පළාත් ඒකාබද්ධ රියදුරු සේවයේ II "අ" පන්තියේ සේවයේ නියුතු නිලධාරීන් II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

iii. දකුණු පළාත් ඒකාබද්ධ රියදුරු සේවයේ I පන්තියේ සේවයේ නියුතු නිලධාරීන් I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

iv. දකුණු පළාත් ඒකාබද්ධ රියදුරු සේවයේ I පන්තියේ වසර නවය (09) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා වැටුප් වර්ධක නවයක් (09) උපයාගෙන ඇති සහ අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන් විශේෂ ශ්‍රේණියට,

ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2013.07.01 දින සිට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සටහන

I පන්තියේ සිට විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා අයදුම්පත්‍ර අංක 04 න් දැක්වෙන ආකෘති පත්‍රය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර අමාත්‍යාංශයේ ලේකම් විසින් නිර්දේශ කර දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

14. අන්තර්කාලීන විධිවිධාන :

14.1 සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පැරණි ව්‍යවස්ථාව යටතේ I පන්තියට පත්වී සිටින නිලධරයන් I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ.

14.2 දැනට සේවයේ නිරත නිලධාරීන් සම්බන්ධයෙන් මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුකූල වීමට ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනයේ සිට වසර තුනක (03) ක සහන කාලයක් ලබා දෙනු ලැබේ. එම කාලය තුළ ඔවුන් විසින් නව ඒකාබද්ධ රියදුරු සේවා ව්‍යවස්ථාවේ සඳහන් සුදුසුකම් සපුරා ගත යුතු ය. මෙහිලා සුදුසුකම් යනුවෙන් අදහස් කරනුයේ කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වීමයි.

සත්‍ය පිටපත
TRUE COPY

15. වෙනත් කරුණු :

15.1 සෑම පත්වීමක් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

15.2 මෙම ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් තීරණය කරනු ලැබේ.

15.3 බඳවා ගැනීම, සේවයේ යෙදවීම, විනය සහ අනෙකුත් ආයතනික කටයුතු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ කොන්දේසි/රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන විධිවිධාන අදාළ වේ.

15.4 සියලුම නිලධාරීන් ස්ථාන මාරු කිරීම් වලට යටත් වේ. ඔවුන් දකුණු පළාතේ කවර හෝ ප්‍රදේශයක වුව ද සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

15. 5 ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධරයන් නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ හා ව්‍යවස්ථාවේ 09 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය භාෂාව හා අනෙක් රාජ්‍ය භාෂාව, අදාළ ප්‍රවීණතා පරීක්ෂණය වලින් සමත්විය යුතුවේ.

සත්‍ය පිටපතකි
TRUE COPY
දිනය 2015/07/29

කේ. කේ. ජේ. රොෂාන්
පරිපාලන නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
දකුණු පළාත

... අංක 256
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2015.07.20 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 22 කි.

2015/07/24

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

සකස් කළේ :- අත්සන .................. පරීක්ෂාකළේ :- අත්සන ..................

(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන: ..................

නම : ගාමිණී වීරවික්‍රම

තනතුර: නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)

දිනය : 2015/06/22

නිල මුද්‍රාව:

ගාමිණී වීරවික්‍රම
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්
(පිරිස් හා පුහුණු)
දකුණු පළාත.

යොමු අංකය: CSS/2/6/2/3

දකුණු පළාත් ඒකාබද්ධ මෝටර් රථ රියදුරු සේවය සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

සත්‍ය පිටපතකි
TRUE COPY
.................. දිනය 2015/07/29

අත්සන : ..................
(ප්‍රධාන ලේකම් , දකුණු පළාත)

නම : ඩබ්. කේ. කේ. අතුකෝරළ

තනතුර : ප්‍රධාන ලේකම්

දිනය : 2015-06-22

නිල මුද්‍රාව :

ඩබ්. කේ. කේ. අතුකෝරළ
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

---

යොමු අංකය : ..................

දකුණු පළාත් ඒකාබද්ධ මෝටර් රථ රියදුරු සේවය සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2015.06.24 දින දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

කේ. කේ. ජේ. රොෂාන්
පරිපාලන නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
දකුණු පළාත

අත්සන: ..................
(ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව.)
දකුණු පළාත

නම:

තනතුර:

දිනය: 2015.06.24

නිල මුද්‍රාව:

ය 256
දකුණු පළාත් ... ආණ්ඩුකාරතුමා
විසින් 2015.07.22 ... කොට ඇති බව
... 22 ...

2015/07/24 ..................
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

1 වන පරිශිෂ්ටය

01. විභාගයේ නම : ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02.

විභාගය පිළිබඳ විස්තර : නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයක් හා වාචික පරීක්ෂණයකි.

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රයෝගික පරීක්ෂණය | 50 | 20 |
| වාචික පරීක්ෂණය | 50 | 20 |
| එකතුව | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :

* නිපුණතා පිළිබඳ ප්‍රයෝගික පරීක්ෂණය :

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් පත් කරනු ලබන පහත සඳහන් නිලධාරීන්ගෙන් යුත් පරීක්ෂණ මණ්ඩලයක් විසින්

(i) දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ විධායක මට්ටමේ නිලධාරියෙකු සභාපති ලෙස

(ii) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකවරයකු

(iii) පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකු

*වාචික පරීක්ෂණය :

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් පත් කරනු ලබන පහත සඳහන් නිලධාරීන්ගෙන් යුත් පරීක්ෂණ මණ්ඩලයක් විසින්

(i) දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ විධායක මට්ටමේ නිලධාරියෙකු සභාපති ලෙස

(ii) ප්‍රධාන ලේකම් කාර්යාලයට පරිබාහිර ආයතනයක විධායක මට්ටමේ නිලධාරියෙකු

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

සත්‍ය පිටපතකි
TRUE COPY
දිනය 2015/09/29

කේ. කේ. ජේ. රොෂාන්
පරිපාලන නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
දකුණු පළාත



... ය 256
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2015.07.22 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 22 කි.
2015/07/24
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | 1. මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම |
| වාචික පරීක්ෂණය<br>1. ආයතන සංග්‍රහයේ විධිවිධාන හා කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම | පරිවාස කාලය, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ, අතිකාල දීමනා, නිවාඩු, දුම්රිය බලපත්‍ර, ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග, සාමාන්‍ය හැසිරීම හා විනය, |
| 2. රජයේ වාහන පරිහරණය හා නඩත්තුව පිළිබඳ දැනුම | * මෝටර් රථ රියදුරන්ගේ රාජකාරී සහ වගකීම<br>* රජයේ වාහන නඩත්තු කිරීම හා ආරක්ෂාව සම්බන්ධයෙන් රියදුරුගේ වගකීම<br>* දෛනික ධාවන සටහන් පොත<br>* වාහන ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම<br>* වාහන අළුත්වැඩියාව හා සේවා කටයුතු<br>* රජයේ වාහන වලට සිදුවන අනතුරු හා අනතුරු සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග |

සටහන : කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වලදී සියලුම විෂයයන් එකවර සමත්විය යුතු යි.


සත්‍ය පිටපතකි
TRUE COPY
දිනය. 2015/07/29

ඉක්. කේ. ජේ. රොෂාන්
පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
දකුණු පළාත

අනුමත අංකය 256
දකුණු පළාත් ආණ්ඩුකාරතුමා
විසින් 2015 . 07 . 22 දින ... කොට ඇති බව
සහතික කරමු. පිටු 22
2015/07/29
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

## 2 වන පරිශිෂ්ඨය

01. විභාගයේ නම : ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර : නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකි.

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | | |
| 1. මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 50 | 20 |
| 2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 50 | 20 |
| එකතුව | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් පත් කරනු ලබන පහත සඳහන් නිලධාරීන්ගෙන් යුත් පරීක්ෂණ මණ්ඩලයක් විසින්

(i) ප්‍රධාන ලේකම් කාර්යාලයේ විධායක මට්ටමේ නිලධාරියෙකු සභාපති ලෙස
(ii) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකවරයකු
(iii) පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකු

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1. මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මෙම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ගතවූ සේවා කාලය තුළ සිදු වී ඇති පරිපාටිමය, නීතිමය වෙනස්වීම් හා නිලධාරියාගේ ශිල්පීය ප්‍රවීණතාවය එම නිලධාරියාගේ ජ්‍යෝෂ්ඨත්වයට ගැලපෙන පරිදි වර්ධනය වී ඇත්දැයි මැන බැලීම සිදු කෙරේ. |

සත්‍ය පිටපතකි
TRUE COPY
දිනය. 2015/07/29

කේ. කේ. ජේ. රොෂාන්
පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

ගැසට් අංකය 256
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2015 - 07 - 22 දින ... කොට ඇති බව
සහතික කරමු. පිටු 22 කි.
2015/07/24

### 3 වන පරිශිෂ්ඨය

01. විභාගයේ නම : ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධාරීන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර : නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකි.

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | | |
| 1. මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 50 | 20 |
| 2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 50 | 20 |
| එකතුව | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් පත් කරනු ලබන පහත සඳහන් නිලධාරීන්ගෙන් යුත් පරීක්ෂණ මණ්ඩලයක් විසින්

(i) ප්‍රධාන ලේකම් කාර්යාලයේ විධායක මට්ටමේ නිලධාරියෙකු සභාපති ලෙස

(ii) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මොටර් රථ පරීක්ෂකවරයකු

(iii) පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකු

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br>2.මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මහාමාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව දැනුමට අමතරව නිලධාරියාගේ ශිල්පීය ප්‍රවීණතාවය එම නිලධාරියාගේ ජ්‍යෙෂ්ඨත්වයට ගැළපෙන පරිදි වර්ධනය වී ඇත්ද යන්න හා නිලධාරියා සේවය කරන ආයතනයට පැවරෙන කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබා ගෙන ඇත්ද යන්න මැන බැලීම සිදු කෙරේ. |

අනුමත අංකය 256
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2015 . 07 . 22 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පි. 22 කි.
2015/07/24
14
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

සත්‍ය පිටපතකි
TRUE COPY
දිනය 2015/09/29
ඉස්. කේ. ජේ. ඉරාෂ්
පරිපාලන නිලධාරී

සත්‍ය පිටපතකි
TRUE COPY

කේ. කේ. ජේ. රොෂාන්
පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
දකුණු පළාත

අයදුම්පත්‍ර 01

.................... දිනය.2015/07/29

දකුණු පළාත් ඒකාබද්ධ රියදුරු සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් II ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය මත උසස් කිරීම සඳහා වූ ආදර්ශ අයදුම්පත්‍රය

I කොටස (නිලධාරියා විසින්ම සම්පූර්ණ කළ යුතුය)

1. මුලකුරු සමඟ නම :-..........................................................................................
2. මුලකුරු වලින් හැඳින්වෙන නම :-..........................................................................................
3. දැනට සේවය කරන කාර්යාලය :-..........................................................................................
4. සේවයට ඇතුලත් වූ දිනය :-..........................................................................................
5. ඒකාබද්ධ සේවයේ පත්වීම් ලිපියේ අංකය :-..........................................................................................
6. පත්වීම ස්ථිර කල දිනය :-..........................................................................................
7. කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය :-..........................................................................................
8. තුන්වන මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගන්නා ලද දිනය :- ..........................................................................................
9. සේවයේ වසර දහය සම්පූර්ණ කළ දිනය :-..........................................................................................

මා විසින් ඉහත සඳහන් කර ඇති සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සඳහන් කරමි

දිනය :-....................................

....................................
අයදුම්කරුගේ අත්සන

---

II කොටස

අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

....................................................................................................මහතා මෙම කාර්යාලයේ සේවය කරන අතර, ඉහත වාර්තා කර ඇති කරුණු ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදිය.

1. පත්වීම ස්ථිර කරවන ලද දිනය :-..........................................................................................
2. III වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ දිනය :-..........................................................................................
3. තුන්වන මට්ටමේ අනෙකුත් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගන්නා ලද දිනය :-..........................................................................................
4. III ශ්‍රේණියේ වසර 10ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දිනය :-..........................................................................................
5. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර 10ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත/නැත
6. එදිනට පූර්වාසන්න වසර 10 තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත
7. I. එදිනට පූර්වාසන්න වසර 10 තුළ අඩ වැටුප් සහ වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත/නැත
   II. වැටුප් රහිත හා අඩ වැටුප් සහිත නිවාඩු ලබා ගෙන තිබේ නම්, ලබා ගත් නිවාඩු ප්‍රමාණය හා ලබා ගන්නා ලද දිනයන් ..........................................................................................
8. I. එම කාලය තුළ නිලධරයා යම් විනයානුකූල දඬුවමකට (අවවාද කිරීමක් හැර) ලක්වී තිබේද? ..........................................................................................
   II. විනය ක්‍රියාමාර්ගයක් හෝ අධිකරණ ක්‍රියාමාර්ගයක් පිළිබඳ කටයුතු කරමින් පවතීද? ..........................................................................................

........ ය 256
ආණ්ඩුකාර ........
විසින් 2015 . 07 . 22 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. ........ 22 ........
2016/07/24

9. සංස්ථාවක හෝ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා නිලධාරියා මුදා හැර සිටීනම් අදාළ කාල වකවානුව පිළිබඳ විස්තර :-

.............................................................................................................................................

.............................................................................................................................................

මෙම නිලධාරියා සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත / නැත එබැවින් ....................දින සිට II වන ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි./ නොකරමි

දිනය :-.....................................

ආයතන ප්‍රධානියාගේ අත්සන :
නම :
පදවි නාමය :
(නිල මුද්‍රාව)

සටහන : ඉහත 1 සිට 9 දක්වා සුදුසුකම් සපුරා නොමැති නම් ඒවා සඳහන් කර එවන්න.
II වන ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.

දිනය :-.....................................

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන :
නම :
පදවි නාමය (නිල මුද්‍රාව) :

සත්‍ය පිටපතකි
TRUE COPY
.................... දිනය 2015/07/24

කේ. කේ. ජේ. රොෂාන්
පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය.
දකුණු පළාත

අංකය 256
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2015.07.22 දින අනුමත කොට ඇති බව
සහතික කරමි. පිටු 22 කි.

2015/07/24

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

සත්‍ය පිටපතකි
TRUE COPY
............ දිනය 2016/07/29

කේ. කේ. පේ. රොෂාන්
පරිපාලන නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
දකුණු පළාත

ඇමුණුම්පත්‍ර 02

දකුණු පළාත් ඒකාබද්ධ රියදුරු සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය මත උසස් කිරීම සඳහා වූ අයදුම් පත්‍රය

I කොටස (නිලධාරියා විසින්ම සම්පූර්ණ කළ යුතුය)

1. මුලකුරු සමඟ නම :-.................................................................
2. මුලකුරු වලින් හැඳින්වෙන නම :-.................................................................
3. දැනට සේවය කරන කාර්යාලය :-.................................................................
4. සේවයට ඇතුලත් වූ දිනය :-.................................................................
5. ඒකාබද්ධ සේවයේ පත්වීම් ලිපියේ අංකය :-.................................................................
6. පත්වීම් ස්ථිර කල දිනය :-.................................................................
7. දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය :-.................................................................
8. II ශ්‍රේණියේ / II "අ" පන්තියේ සේවයේ වසර නවය සම්පූර්ණ කල දිනය :-.................................................................

මා විසින් ඉහත සඳහන් කර ඇති සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය :-...................................

...................................
අයදුම්කරුගේ අත්සන

II කොටස

අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

.................................................................මහතා මෙම කාර්යාලයේ සේවය කරන අතර, ඉහත වාර්තා කර ඇති කරුණු ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදිය.

1. II ශ්‍රේණියට උසස් කරන ලද දිනය :-...................................
2. දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ දිනය :-...................................
3. II ශ්‍රේණියේ වසර 09ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දිනය :-...................................
4. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර 09ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත/නැත
5. එදිනට පූර්වාසන්න වසර 09 තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත
6. I. එදිනට පූර්වාසන්න වසර 09 තුළ අඩ වැටුප් සහ වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත/නැත
   II. වැටුප් රහිත හා අඩ වැටුප් සහිත නිවාඩු ලබා ගෙන තිබේ නම්, ලබා ගත් නිවාඩු ප්‍රමාණය හා ලබා ගන්නා ලද දිනයන් ...................................
7. I. එම කාලය තුළ නිලධරයා යම් විනයානුකූල දඬුවමකට (අවවාද කිරීමක් හැර) ලක්ව තිබේද?
   ...................................
   II. විනය ක්‍රියාමාර්ගයක් හෝ අධිකරණ ක්‍රියාමාර්ගයක් පිළිබඳ කටයුතු කරමින් පවතීද?
   ...................................

ලේඛන අංකය 256
දකුණු පළාත් සභා ආණ්ඩුකාර තුමා
වෙතින් 2015.07.22 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 22 කි.
2016/07/24
ආණ්ඩුකාර ලේකම්

8. සංස්ථාවක හෝ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා නිලධාරියා මුදා හැර සිටිනම් අදාල කාල

වකවානුව පිළිබඳ විස්තර :-

..............................................................................................................................................

..............................................................................................................................

මෙම නිලධාරියා සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත / නැත. එබැවින් ....................දින සිට I ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි./ නොකරමි.

දිනය :-......................................

ආයතන ප්‍රධානියාගේ අත්සන :
නම :
පදවි නාමය :
(නිල මුද්‍රාව)

සටහන : ඉහත 1 සිට 8 දක්වා සුදුසුකම් සපුරා නොමැතිනම් ඒවා සඳහන් කර එවන්න.
I වන ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.

දිනය :-......................................

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන :
නම :
පදවි නාමය (නිල මුද්‍රාව) :

සත්‍ය පිටපතකි
TRUE COPY
.............. දිනය 2015/07/24

කේ. කේ. ජේ. රොෂාන්
පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
දකුණු පළාත

අනුමත අංකය 256
දකුණු පළාත් ආණ්ඩුකාරතුමා
විසින් 2015 . 07 . 22 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 22 කි.

2015/07/24

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

03

දකුණු පළාත් ඒකාබද්ධ රියදුරු සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ අයදුම්පත්‍රය

I කොටස (නිලධාරියා විසින්ම සම්පූර්ණ කළ යුතුය)

1. මුලකුරු සමඟ නම :-..........................................................................................................

2. මුලකුරු වලින් හැඳින්වෙන නම :-..........................................................................................

3. දැනට සේවය කරන කාර්යාලය :-..........................................................................................

4. සේවයට ඇතුලත් වූ දිනය :-..........................................................................................

5. ඒකාබද්ධ සේවයේ පත්වීම් ලිපියේ අංකය :-.............................................................................

6. පත්වීම් ස්ථිර කල දිනය :-..........................................................................................

7. තුන්වන කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය :-.......................................................................

8. I ශ්‍රේණියේ සේවයේ වසර නවය සම්පූර්ණ කල දිනය :-.................................................

මා විසින් ඉහත සඳහන් කර ඇති සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය :-.....................................

.........................................
අයදුම්කරුගේ අත්සන

---

II කොටස

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

..........................................................මහතා මෙම කාර්යාලයේ සේවය කරන අතර , ඉහත වාර්තා කර ඇති කරුණු ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදිය.

1. I ශ්‍රේණියට උසස් කරන ලද දිනය : .......................................................................

2. තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ දිනය :-.............................................

3. I ශ්‍රේණියේ වසර 09 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දිනය :-...........................

4. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර 09 ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත/නැත

5. එදිනට පූර්වාසන්න වසර 09 තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත

6. I. එදිනට පූර්වාසන්න වසර 09 තුළ අඩ වැටුප් සහ වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත/නැත

II. වැටුප් රහිත හා අඩ වැටුප් සහිත නිවාඩු ලබාගෙන තිබේ නම් ලබා ගත් නිවාඩු ප්‍රමාණය හා ලබා ගන්නා ලද දිනයන් ..........................................

සත්‍ය පිටපතකි
TRUE COPY

ඡේ. කේ. ජේ. රොෂාන්
පරිපාලන නිලධාරි
...... ලේකම් කාර්යාලය

...... ය 256
...... ගල් ...... ආරක්ෂකාරතුමා
විසින් 2015. 07. 22 දින ...... කොට ඇති බව
සහතික කරමු. පිටු 22 කි.
2015/07/26

7. I. එම කාලය තුළ නිලධාරයා යම් විනයානුකූල දඬුවමකට (අවවාද කිරීමක් හැර ) ලක්වී තිබේද?

II. විනය ක්‍රියාමාර්ගයක් හෝ අධිකරණ ක්‍රියාමාර්ගයක් පිළිබඳ කටයුතු කරමින් පවතීද?.............................

8. සංස්ථාවක හෝ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා නිලධාරියා මුදාහැර සිටීනම් අදාළ කාල වකවානුව පිළිබඳ විස්තර :-

.............................................................................................................................................

.............................................................................................................

මෙම නිලධාරියා සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත/නැත. එබැවින් ..................... දින සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි./ නොකරමි .

දිනය: ..........................................

ආයතන ප්‍රධානියාගේ අත්සන:

නම:

පදවි නාමය(නිල මුද්‍රාව):

සටහන: ඉහත 1 සිට 8 දක්වා සුදුසුකම් සපුරා නොමැති නම් ඒවා සඳහන් කර එවන්න.

විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.

දිනය: ..............................................

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන:

නම:

පදවි නාමය(නිල මුද්‍රාව):

සත්‍ය පිටපතකි
TRUE COPY

............ දිනය 2016/09/29

කේ. කේ. ජේ. රොෂාන්
පරිපාලන නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය.
දකුණු පළාත

256

2015. 07. 22 දින අනුමත කොට ඇති බව

22

2015/07/24

අයදුම්පත්‍ර 04

දිනය 2015/07/...

පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
දකුණු පළාත

**2013.07.01 දිනට දකුණු පළාත් ඒකාබද්ධ රියදුරු සේවයේ I ශ්‍රේණියේ වසර 09ක සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන් විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා වූ අයදුම්පත්‍රය**

**I කොටස (නිලධාරියා විසින්ම සම්පූර්ණ කළ යුතුය)**

1. මුලකුරු සමඟ නම :-..........................................................
2. මුලකුරු වලින් හැඳින්වෙන නම් :-..........................................................
3. දැනට සේවය කරන කාර්යාලය :-..........................................................
4. සේවයට ඇතුලත් වූ දිනය :-..........................................................
5. ඒකාබද්ධ සේවයේ පත්වීම් ලිපියේ අංකය :-..........................................
6. පත්වීම ස්ථිර කළ දිනය :-..............................................
7. I පන්තියේ සේවයේ වසර 09 සම්පූර්ණ කළ දිනය :-......................................

මා විසින් ඉහත සඳහන් කර ඇති සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය :-......................................

......................................

අයදුම්කරුගේ අත්සන

---

**II කොටස**

**අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

..........................................................මහතා මෙම කාර්යාලයේ සේවය කරන අතර, ඉහත වාර්තා කර ඇති කරුණු ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදිය.

1. I ශ්‍රේණියට උසස් කරන ලද දිනය :-..............................................
2. 2013.07.01 දිනට රියදුරු සේවයේ I ශ්‍රේණියේ වසර 09ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇත / නැත
3. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර 09 ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත/නැත
4. එදිනට පූර්වාසන්න වසර 09 තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත
5. I. එදිනට පූර්වාසන්න වසර 09 තුළ අඩ වැටුප් සහ වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත/නැත
   II. වැටුප් රහිත හා අඩ වැටුප් සහිත නිවාඩු ලබා ගෙන තිබේ නම්, ලබා ගත් නිවාඩු ප්‍රමාණය හා ලබා ගන්නා ලද දිනයන් ..........................................................
6. I. එම කාලය තුළ නිලධරයා යම් විනයානුකූල දඬුවමකට (අවවාද කිරීමක් හැර) ලක්වී තිබේද?
   ..........................................................
   II. විනය ක්‍රියාමාර්ගයක් හෝ අධිකරණ ක්‍රියාමාර්ගයක් පිළිබඳ කටයුතු ක්‍රියාත්මක වේද?
   ..........................................................

අනුමැති අංකය 256

ආණ්ඩුකාරතුමා විසින් 2015.07.22 දින අනුමත කොට ඇති බව සහතික කරමු. පිටු 22 කි.

2015/07/24

7. සංස්ථාවක හෝ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා නිලධාරියා මුදා හැර සිටීනම් අදාළ කාල වකවානුව පිළිබඳ විස්තර :-

..............................................................................................................................................

.......................................................................................................................

මෙම නිලධාරියා සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත / නැත. එබැවින් 2013.07.01 දින සිට විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි./ නොකරමි

දිනය :-........................................

ආයතන ප්‍රධානියාගේ අත්සන :

නම :

පදවි නාමය :

(නිල මුද්‍රාව)

සටහන : ඉහත 1 සිට 7 දක්වා සුදුසුකම් සපුරා නොමැති නම් ඒවා සඳහන් කර එවන්න.
2013.07.01 දින සිට විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි. / නොකරමි.

දිනය :-........................................

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන :

නම :

පදවි නාමය (නිල මුද්‍රාව) :

සත්‍ය පිටපතකි
TRUE COPY
දිනය 2015/07/29

අංකය 256

2015.07.22 දින අනුමත කොට ඇති බව සහතික කරමි. පිටු 22 කි.

2015/07/24